# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2261/7 - 2022 ජනවාරි මස 03 වැනි සඳුදා - 2022.01.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය)**

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ නියාගම ප්‍රාදේශීය සභාවේ සභික ධූරයේ පුරප්පාඩුවක් පිරවීම

පක්ෂ සාමාජිකත්වය අහිමිවීම හේතුකොට ගෙන නියාගම ප්‍රාදේශීය සභාවේ සභික ධූරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද,

ඉහත කී ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ නියාගම ප්‍රාදේශීය සභාවේ අංක 09 නියාගම කොට්ඨාසයට තේරී පත් වූ තොටගොඩ ගමගේ ටෙරී හේමාල් ජයවීර අයත් වන්නා වූ එක්සත් ජාතික පක්ෂය නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහක (30) කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතුයැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූද, එම පක්ෂයට අයත් වන්නාවූ ද, එම නියාගම ප්‍රාදේශීය සභාවේ අංක 09 නියාගම කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද,

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා අතුකෝරල දොන් චාමර නිශාන්ත විජේගුණවර්ධන නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද,

නියාගම ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි, වේවැල්වල හේවගේ රවීන්ද්‍ර විජය කුමාර වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1)(අ) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් අතුකෝරල දොන් චාමර නිශාන්ත විජේගුණවර්ධන, නියාගම ප්‍රාදේශීය සභාවේ අංක 09, නියාගම කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් ප්‍රකාශ කරමි.

ඩබ්ලිව්. එච්. ආර්. විජය කුමාර,
තේරීම්භාර නිලධාරි,
නියාගම ප්‍රාදේශීය සභාව.

2022 ක් වූ ජනවාරි මස 03 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
ගාල්ල.

EOG 01-0007

1A - PG 35728 — 20 (2022/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.